## 1.1 හැඳින්වීම

කලාව වූ කලී නිර්මාණයෝය. එමගින් සිදුවන්නේ මානවයාගේ ඉන්ද්‍රියනට ගෝචර වන දෑ හා එහි විෂය සංස්කරණය කොට දැක්වීමයි. ඒඅතර නර්තනය මනුෂ්‍යයාගේ පැවැත්මේ සහ මනුෂ්‍යත්වයේ විවිධ පැතිකඩ නිරූපණය කරයි. එහිදී කලාකරුවා අතින් සිදුවනුයේ නිර්මාණාත්මක, නිදහස් චින්තාවලින් ඔස්සේ ස්වභාවදර්මයා විසින් උත්පාදිත වූ ද්‍රව්‍යයක් හෝ ක්‍රියාවක් විශ්ව සාධාරණ සංකල්පයකට ගැළපෙන ලෙස හැඩගැස්වීමකි. කලා මාධ්‍ය කුමක් වුවද මෙම තත්ත්වය පොදු ක්‍රියාවකි. ස්වභාවදර්මයේ හෝ සාමූහික ශ්‍රම ක්‍රියාකාරිත්වයේ රිද්මිය ප්‍රතිඵලයක් ලෙසට කලාව ලොව උපත ලැබිය. ඒ ප්‍රතික්‍රියාව හේතුවෙන් කලාංගයක් වූ නර්තන කලාවද උපත ලද බව හැගේ.

නර්තනය වූ කලී ශරීරය භාවිතයෙන් සිදුකෙරෙන අංගයකි. අතීතයේ රණකාමීත්වය උදෙසාද නර්තනය යොදගත් බව සඳහන් වේ. නූතනය වනවිට එනම් 20 වන සියවස පමණ වන විට නර්තනය අතිශයින්ම ප්‍රකාශනයක් සිදුකළ හැකි මාධ්‍යයක් ලෙස යොදාගත් ශබ්ද කෝෂ හරහා නිර්වචන ලබා දෙන්නට විය. මෙසේ නර්තනය පිළිබඳ විවිධ කාල වලදී විවිධ වූ නිර්වචන සිදුකර ඇති බව පැහැදිලි වේ. නමුත් නර්තනය යන්න එහිදී නිර්වචනය වුවද එහි සමාජ අවශ්‍යතාවය පිළබඳව ඉතා විරල අදහස් ප්‍රකාශනයක් දක්නට ලැබේ. මෙය බොහෝ සෙයින් වැදගත් වනුයේ නර්තනය පිළිබඳව හා පවතින සමාජය කෙරෙහි විමසුම් ඇසීම තුළදීය. එය සමාජයක කලා නිර්මාණයන්ගේ පැවැත්මට අත්‍යවශ්‍ය කාර්යයක් වේ. මිනිසා තම පැවැත්මේ අවශ්‍යතාවයනට, කලාත්මක භාවිතාවන්ට කලා නිර්මාණ යොදා ගත් අතර ඒ තුළ යම් යම් අංශ කෙරෙහි සුවිශේෂත්වය ලබා දෙන්නට විය. මිනිසාගේ චිත්ත අභ්‍යන්තරයෙහි ඇතිවන හැඟීම් ප්‍රකාශනයට පත් කිරීමේ ප්‍රකාශන මාධ්‍යයක් ලෙසට නර්තනය සමාජයේ පැවතුනි. මෙය සමාජීය වර්ධනයත් සමඟම වර්ධනය වූවකි.

නූතනය දක්වා නර්තනය වර්ධනය වීමට කිසියම් ආකාරයක හේතු සාධකයන්ගේ බලපෑම තිබිය යුතුය. එය අපගේ අධ්‍යයනයට භාජනයවීම කාලීනව වැදගත් වේ. මීට අමතරව කලා මාධ්‍යයන් කෙරෙහි ප්‍රබල වශයෙන් බලපාන්නා වූ අංශයක් ලෙසට විචාර කලාව හැඳින්විය හැකිය. මෙය නිවැරදිව හඳුනා ගනිමින් කලා ක්ෂේත්‍රය කෙරෙහි විචාරයේ මැදිහත්වීම ලබාදීම වර්තමානයේ අත්‍යවශ්‍ය ප්‍රවේශයක් ලෙසට පැනනැගී ඇත. විශේෂයෙන් නූතනයේ ලාංකේය නර්තනයට එහි අවශ්‍යතාවය ඕනෑකර තිබේ. එයට හේතුව වන්නේ අද වනවිට ලාංකේය නූතන නර්තනයට යොමු වී ඇති සමාජමය හා විවේචනාත්මක බැල්මේ ස්වභාවයයි.

ලාංකේය නර්තනයේ ඉතිහාසය දිගු කලකට දිව ගියද මෙම පර්යේෂණයට අදාළව වැඩි වශයෙන් අවධානය යොමු කෙරෙනුයේ නූතන නර්තනය කෙරෙහිය. නර්තන විෂය පතල විෂය

පාරාසයක් නිසා එසේ සීමාකිරීමට ලක්කිරීම පර්යේෂණයේ සාර්ථකත්වයට හේතු වනු ඇත. නමුත් සමස්ථ වශයෙන් නර්තනයේ සමාජ අවශ්‍යතාවය වැදගත් වන හෙයින් ඒ පිළිබඳව දේශිය වශයෙන් පමණක් නොව පොදු විශ්විය තලයක සිට අවධානය යොමු කිරීමට කටයුතු කෙරේ. ඒ අතර දේශිය නර්තනයද එක් අංශු මාත්‍රයක් වන නිසාම ඒ කෙරෙහිද අවධානය යොමු කිරීමට උත්සුක වේ.

විචාරයක් යනු නිර්මාණයක හොඳ නරක පෙන්වා දෙන කිසියම් දාර්ශනික ලියවිල්ලක් ලෙස යම් දෙනා අර්ථ ගන්වයි. එසේ වුවද විචාරයක් තුළ නිර්මාණයට අදාළ සියලු අංගෝපාංග කෙරෙහි අවධානය යොමු විය යුතු ප්‍රධාන අංග බොහෝමයක් වේ. ප්‍රධාන වශයෙන් අදාළ කලා නිර්මාණය සමාජයට අවශ්‍ය වන්නේද යන්න සෙවීම විය යුත්තකි. අප රට තුළ පවතින කලා විචාර ක්ෂේත්‍රය තුළ එම ක්‍රියාවලිය සිදුවේද යන්න ගැටලුවකි. ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයක් නිසාම පර්යේෂණයේ අරමුණු අතර මූලිකත්වය ඊට යොමු කෙරේ. විද්වත් මතයන්ට අනුව හා මූලාශ්‍ර අනුව සලකා බැලීමේදී විචාරය පිළිබඳ අර්ථකථන හා අන් කලා මාධ්‍ය විචාරයන් පිළිබඳ පුළුල් අවධානය යොමු කර ඇති බවක් පෙනී යන නමුත් නර්තන විචාරය කෙරෙහි විද්වත් අවධානයට අවම මට්ටමක් දක්නට ලැබේ. එය කාලීන වශයෙන් බලපානු ලබන ගැටලු තත්ත්වයක් බව මේ වනවිටද පැහැදිලිය. අන් කලාංග මෙන්ම නර්තනයද සමාජ අවශ්‍යතාවන් මත වැඩෙමින් ජීවය ලබන කලාංගයක් හේතුවෙන් ඒ සඳහා ද ක්‍රමික විචාර කලාවක් අවශ්‍ය වේ. අදාළ පර්යේෂණය යටතේ ඒ පිළිබඳව ප්‍රමුඛ අවධානය යොමු කිරීම කාලීන චින්තනයකි.

ලාංකේය නර්තනය විවිධ ඥාණ අවශ්‍යතා ඔස්සේ ගමන් කරමින් යයි. එහිදී රටේ කලා නිර්මාණයන්හි අනාගතය පිළිබඳව සොයාබැලීම කලා රසවින්දකයින් ලෙසට මෙන්ම ක්ෂේත්‍රය පිළිබඳ ඇල්මක් ඇති අයගේ ද වගකීමකි. මිනිසාගේ රසවින්දනය මත කලාව රැඳී පවතින අතර කලාව  මත රසවින්දනය රැඳී පවතී. මෙය කිසිදිනක වෙන්කල නොහැකි තත්ත්වයකි. මෙම පර්යේෂණයේදී අදාළ තත්ත්වය පිළිබඳව සොයා බැලීමට අදහස් කෙරෙනුයේ ඉහත ආකාරයේ වගකීමක් සමාජමය වශයෙන් හා කාලීන වශයෙන් ඉටු කිරීමේ අටියෙනි. ඒ අනුව නර්තන කලාවේ අනාගතය කෙසේ සිදුවේද ඒ සඳහා විචාර කලාව මගින් ලබා දියහැකි දායකත්වය කෙබඳු ද යන්න පහදා දීමට උත්සුක වේ.

"ශ්‍රී ලාංකේය නූතන නර්තනය හා බැදි විචාර භාවිතයේ අවශ්‍යතාව හා ගැටලු" යන පර්යේෂණ යටතේ නූතන නර්තනය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම වැදගත් වනු ඇත. එසේම ඒ දක්වා නර්තනයේ ස්වභාවය, ඒ ස්වභාවයන්ට බලපෑ සමාජ ආර්ථික හේතූන් මොනවාද යන්න මනාව අධ්‍යයනයට කිරීමට ලක් කෙරේ. එසේම ඒ නර්තනය හා සම්බන්ධ විචාර කලාව වැදගත් වන්නේ කෙසේද යන්න පිළිබඳවද ඍජුව අවධානය යොමු කෙරිණි. මේ

පිළිබඳ අන් කලා මාධ්‍යයන් සමඟ සන්සන්දනාත්මකව සලකා බැලුනි. අදාළ මූලාශ්‍රයන් අනුව දැනුවත් වෙමින් ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඔස්සේ මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීමට කටයුතු කළ අතර ඒ ඔස්සේ සාර්ථකත්වය අපේක්‍ෂා කෙරිණි.

අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හා විචාර පක්‍ෂයේ විද්වතුන් ආදීන්ගේ සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත සපයා ගත් අතර ස්වයං අධ්‍යයනය ඔස්සේද ගුණාත්මක දත්ත සපයා ගැනීමක් සිදු කරන්නට විය. ඒ ඔස්සේ නිබන්ධනයේ අරමුණු හා අභිමතාර්ථ වෙත ලඟා වන්නට උත්සහ දැරිය. තම උපකල්පනය ඔස්සේ යමින් අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ගුණාත්මක දත්ත රැස්කොට විශ්ලේෂණය කිරීම මෙන්ම සම්මුඛ සාකච්චා මගින් අදහස් විමසීම ඔස්සේ පර්යේෂණයේ අසාර්ථකත්වය අපේක්‍ෂා කළෙමි.

මෙම පර්යේෂණය හුදෙක් නිබන්ධනයකට සීමා නොකොට එම දත්ත පදනම් කර ගනිමින් නර්තන ක්ෂේත්‍රයේ අනාගතය කෙරෙහිද විචාර කලාව ඔස්සේ එය වර්ධනීය තත්ත්වයකට පත් කිරීම උදෙසාද සාධනීය ප්‍රවේශයක් ලෙස යොදා ගැනීමට යොමු කරවීම අරමුණු කරගනී. එසේම ඊට අදාළ ක්ෂේත්‍රය යටතේ පවතින ගැටලුකාරී තත්ත්වයන් පෙන්වා දෙමින් ඒවා නිරාකරණය කර ගැනීමට ක්‍රමවේද ඔස්සේ ක්ෂේත්‍රයට ගුණාත්මක දායකත්වයක් ලබාදීමට හැකි අයුරින් දායකවීම අරමුණ වේ. මේ හේතුන් මත මෙම පර්යේෂණය කාලීන මෙන්ම ගුණාත්මක වනු ඇතැයි විශ්වාස කෙරේ.